විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு

**MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM**

**මාධ්‍ය නිවේදනය**

# විදේශ කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ලංකා - EXPO-2027 පිළිබඳ රාජ්‍යතාන්ත්‍රික ප්‍රජාව දැනුවත් කිරීමේ සාකච්ඡාවක් පවත්වයි

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, 2026 ජූනි 12 වැනි දින, විදේශ අමාත්‍යාංශ පරිශ්‍රයේදී, ශ්‍රී ලංකා-EXPO 2027 පිළිබඳ රාජ්‍යතාන්ත්‍රික ප්‍රජාව දැනුවත් කිරීමේ සාකච්ඡාවක් පැවැත්වීය. කොළඹ පදනම් කරගත් රාජ්‍යතාන්ත්‍රික බලකායේ ප්‍රධානීන් සහ නියෝජිතයින් මෙන්ම, නවදිල්ලියේ සහ අනෙකුත් විදේශ අගනගරවල පිහිටි, ශ්‍රී ලංකාව වෙත ප්‍රතීතනය කර ඇති දූත මණ්ඩල ප්‍රධානීන්/ ඔවුන්ගේ නියෝජිතයින් මෙම සාකච්ඡාවට සහභාගී විය. විදේශයන්හි වෙසෙන රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් මාර්ගගතව මෙම අවස්ථාවට සහභාගී විය.

මෙම අවස්ථාව, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය විජිත හේරත් සහ කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති යන අමාත්‍යවරුන්ගේ සම සභාපතිත්වයෙන් පැවැත්විණි. කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය චතුරංග අබේසිංහ මහතා ද මෙම සාකච්ඡාවට සහභාගී විය.

2027 ජනවාරි 14 වැනි දින සිට 17 වැනි දා දක්වා කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වීමට නියමිත EXPO-2027, මෑත වසරවලදී ශ්‍රී ලංකාවේ පැවැත්වෙන විශාලතම ජාත්‍යන්තර ව්‍යාපාරික ප්‍රදර්ශනය වනු ඇති බව, පිළිගැනීමේ අදහස් දක්වමින්, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ ලේකම් අරුණි රණරාජ සඳහන් කළාය.

රැස්ව සිටි පිරිස අමතමින්, අමාත්‍ය විජිත හේරත්, ජාත්‍යන්තර ආර්ථික කටයුතු පුළුල් කිරීම, වෙළෙඳාම සහ ආයෝජන ප්‍රවර්ධනය කිරීම සහ ලොව පුරා රටවල් සමඟ හවුල්කාරිත්වයන් ශක්තිමත් කිරීම සඳහා ප්‍රධාන වේදිකාවක් ලෙස ශ්‍රී ලංකා-EXPO 2027 හි වැදගත්කම අවධාරණය කළේය. ව්‍යාපාරික ප්‍රජාවන්, වාණිජ මණ්ඩල, වෙළෙඳ සංගම් සහ ආයෝජක කණ්ඩායම්වල සහභාගීත්වය දිරිගැන්වීමේදී රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලවලට ඉටු කළ හැකි වැදගත් කාර්යභාරය අමාත්‍ය හේරත් අවධාරණය කළ අතර, කොළඹදී පැවැත්වෙන ශ්‍රී ලංකා-EXPO 2027 සඳහා එක්වන ලෙස රජයන්ට, ආයතනවලට සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන්ට ආරාධනා කළේය.

රජයේ ජාතික ඛනිජ සම්පත් ප්‍රතිපත්තිය පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයමින්, ශ්‍රී ලංකාවේ අපනයන හා ආයෝජන ප්‍රවර්ධන ප්‍රයත්නයන් ඛනිජ සම්පත් ක්ෂේත්‍රය ඇතුළු පුළුල් පරාසයක අංශ ආවරණය වන පරිදි සංවර්ධනය කරන බවට, රාජ්‍යතාන්ත්‍රික බලකාය විසින් අසන ලද පැනයකට පිළිතුරු දෙමින්, කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය සුනිල් හඳුන්නෙත්ති පැහැදිලි කළේය.

නියෝජ්‍ය අමාත්‍ය චතුරංග අබේසිංහ මහතා, ශ්‍රී ලංකා - EXPO 2027 සම්බන්ධයෙන් වෙළඳ සබඳතා පුළුල් කිරීම සහ හවුල්කාරිත්වයන් ගොඩනැගීම සඳහා වන ගෝලීය වටිනාකම් සමඟ සම්බන්ධ වීමට නිර්මාණය කරන අවස්ථා පිළිබඳ සඳහන් කළේය.

අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපති, මංගල විජේසිංහ මහතා, EXPO-2027 පිළිබඳව, සහභාගී වූ පිරිසට සවිස්තරාත්මක ඉදිරිපත් කිරීමක් සිදු කළේය.

EXPO 2027 සඳහා ශ්‍රී ලංකාවේ සහභාගීත්වය වෙනුවෙන් සහාය වීමට සහ දිරිගැන්වීමට හැකි ආකාරය පිළිබඳ අදහස් හුවමාරු කර ගැනීමට, රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩල සහ ජාත්‍යන්තර හවුල්කරුවන්ට, මෙම සාකච්ඡාව අවස්ථාවක් සැලසීය.

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් තිලකා ජයසුන්දර සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීහු ද මෙම සාකච්ඡාවට සහභාගී වූහ.

**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය**
**කොළඹ**

**2026 ජුනි 16 වැනි දින**


**Foreign Affairs**
විදේශ කටයුතු
வெளிநாட்டு அலுவல்கள்

**Republic Building, Colombo 1**
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1
குடியரசுக் கட்டிடம், கொழும்பு 1
☎ 2 325 373/5, 2 207 200/7
cypher@mfa.gov.lk

**Foreign Employment**
විදේශ රැකියා
வெளிநாட்டு வேலைவாய்ப்பு

**17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 5**
17 වන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 5
17 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 5
☎ 2 331 200
info@mfe.gov.lk

**Tourism**
සංචාරක
சுற்றுலாத்துறை

**No 03, Times Building, Bristol Street (Sir Razik Fareed Mw), Colombo 1**
අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය (සර් රාසික් ෆරීඩ් මාවත), කොළඹ 1
இல.03, டைம்ஸ் கட்டிடம், பிரிஸ்டல் தெரு (சர் ராசிக் ஃபரீத் மாவத்தை), கொழும்பு 1
☎ 2 381 798, 2 321 222
secretary@tourismmin.gov.lk